

# ගෙවී ගිය දොළොස් මහේ ජගත් සිනමා කෙළි මඬලේ විකුම් පෑ ශ්‍රී ලාංකේය සිනමාව

1957 වර්ෂයේ කෑන්ස් සිනමා උළෙල නියෝජනය කල ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'රේඛාව' සිනමාපටයේ සිට 2015 වර්ෂයේ දෙසැම්බර් මස දිල්ලි අන්තර්ජාතික සිනමා උළෙල නියෝජනය කල දේවින්ද කෝන්ගහගේගේ 'භවතරණ' සිනමාපටය දක්වා වූ සිනමා ගමන්මගේ ශ්‍රී ලාංකේය වෘත්තාන්ත සිනමාපට 201ක්, අන්තර් ජාතික සිනමා උළෙලවල් 320කට ආසන්න සංඛ්‍යාවක් නියෝජනය කරමින්, ශ්‍රී ලංකාව උදෙසා ජාත්‍යන්තර සිනමා වෙළඳපොළක් හිමිකර ගැනීමේ දැඩි අදිටනින් යුතු වූ අරගලයක නියැලුනද, වානිජ්‍යයම ස්ථාවරත්වයක් සහිත සිනමා කර්මාන්තයක් ලෙසින් ශ්‍රී ලාංකේය සිනමාව තවමත් ඉස්මතු නොවීම කැපී පෙනේ. එනමුදු අන්තර්ජාතික සිනමා උළෙලයන් තුල ශ්‍රී ලාංකේය කලාත්මක සිනමාපට උදෙසා හිමි පිළිගැනීම ප්‍රශංසනීයය.

දීර්ඝ වෘත්තාන්ත සිනමාපට

01. රෝයල් රීල් සම්මානය (Royal Reel Award) - මංගල ගමන - 09 වැනි කැනඩා අන්තර්ජාතික සිනමා උළෙල (වැන්කුවර් - කැනඩාව) අප්‍රියෙල්, 2015

2015 වර්ෂයේදී ශ්‍රී ලංකාව සිය පළමු අන්තර්ජාතික සිනමා ජයග්‍රහණය වාර්තා කරන ලද්දේ, එම වර්ෂයේ අප්‍රියෙල් මස කැනඩාවේ වැන්කුවර් නුවර පැවති 09 වෙනි කැනඩා අන්තර්ජාතික සිනමා උළෙලේදීය. මෙහිදී නන්දන හේවාපන්නගේ කුළුදුල් සිනමා සිත්තම වූ 'මංගල ගමන' (Wedding Journey) එම උළෙලේ විදෙස් සිනමාපට තරග අංශය (Foreign Film Competition) යටතේ පිරිනමන 'රෝයල් රීල්' සම්මානයෙන් පිදුම් ලැබීමට සමත් විය.



දකුණු ආසියානු කලාපීය රාජ්‍යයන් 08හි සිනමාපට උදෙසා පමණක් සීමාවූ සාර්ක් සිනමා උළෙලේ ආරම්භය 2011 වර්ෂයේදී සනිටුහන් විය. වර්තමානයේදී කෙටි හා දීර්ඝ වෘත්තාන්ත සිනමාපට වෙනුවෙන් පමණක් සම්මාන පිරිනමන මෙම උළෙලේ 2015 වර්ෂයේදී අංශ ද්විත්වය යටතේම තිරගත වූ මුළු සිනමාපට සංඛ්‍යාව 18කි. මෙහිදී 'පටිභාන' (Perception) සහ 'මෝටර් බයිසිකල් ' (Motor Bicycle) ඇතුලත් වූ දීර්ඝ වෘත්තාන්ත සිනමාපට අංශය යටතේ රටවල් 05ක් නියෝජනය කල සිනමාපට 09ක් තිරගත විය. එකී සිනමාපට අතුරින් 'පටිභාන' සිනමාපටය අධ්‍යක්ෂණය වෙනුවෙන් රබින් චන්ද්‍රසිරි උළෙලේ හොඳම අධ්‍යක්ෂක ලෙසත්, සමීර රංගනගේ සිනමා අධ්‍යක්ෂණයක් වූ 'මෝටර් බයිසිකල් ' සිනමාපටය උළෙලේ හොඳම වෘත්තාන්ත සිනමාපටය ලෙසත් සම්මානයට පාත්‍ර වූහ. ඉහත සිනමාපට ද්විත්වයම අදාළ සිනමා අධ්‍යක්ෂකවරුන් දෙපළගේ කුළුදුල් සිනමා නිර්මාණයන් වීම විශේෂත්වයකි.

1961 වර්ෂයේදී සමාරම්භය සනිටුහන් කල ස්zලීන් සිනමා උළෙල, වර්තමානයේදී ළමා හා යොවුන් සිනමාපට උදෙසා ලොව ක්‍රියාත්මක පැරණිතම සහ විශාලතම සිනමා උළෙල ලෙසට ලෝක සම්භාවනාවට පාත්‍ර වේ. වසර 55ක ඉතිහාසයට හිමිකම් කියන ස්zලීන් සිනමා උළෙලේ තරගකාරීත්වය ඉතාම ඉහළ අගයක් ගන්නා අතර, සියළුම නිළ ශ්‍රේණිගත කිරීම් වලට අනුව ලොව වඩාත් තරගකාරීම ළමා හා යොවුන් සිනමා උළෙලවල් 05 අතුරින් එකක් ලෙසට ස්ලීන් සිනමා උළෙල සැලකේ. මෙම නිසා මෙම උළෙලේ ප්‍රධානතම තරගකාරී අංශ ද්විත්වයෙන් කුමන හෝ අංශයක් නියෝජනය කිරීමට යම් සිනමාපටයක් සුදුසුකම් ලබයිද, එයද ශ්‍රී ලංකාව වැනි රටක් ලබන ජයග්‍රහණයක් හා සමානය. 2015 වර්ෂයේදී ඉන්දික ෆර්ඩිනැන්ඩුගේ කුළුදුල් සිනමා නිමැවුම වූ 'හෝ ගානා පොකුණ' ( The Singing Pond) සිනමාපටය ඇතුළුව සිනමාපට 09ක් ස්ලීන් සිනමා උළෙලේ අන්තර්ජාතික ළමා වෘත්තාන්ත සිනමාපට තරගය ( International Competition of Feature Films for Children) නියෝජනය කිරීමට සුදුසුකම් ලැබ තිබූ අතර, එහිදී හොඳම ළමා රංගනය උදෙසා පිරිනමන City of Zlin සම්මානය 'හෝ ගානා පොකුණ' සිනමා සිත්තමේ අද්විතීය රංගනයක නියැලෙන ළමා නළු නිළියන් දහඅට දෙනා වෙනුවෙන්ම පිරිනමන ලදී.



පෙර වර්ෂයන්හිදී මෙන්ම 2015 වර්ෂයද මෙරට සිනමාපට උදෙසා ජාත්‍යන්තර සිනමා වෙළඳපොලක් හිමිකර නොදෙමින් අවසානය සනිටුහන් කලද, එම වර්ෂයේදී ශ්‍රී ලාංකේය දීර්ඝ වෘත්තාන්ත සිනමාපට 26ක් ශ්‍රී ලංකාවේදී මෙන්ම විදේශයන්හිදී පැවති අන්තර්ජාතික සිනමා උළෙලයන් 35කට ආසන්න සංඛ්‍යාවකදී තිරගතකරලමින් අන්තර්ජාතික සිනමා සම්මාන 09කින් පිදුම් ලැබීමට සමත්වීම, දේශීයව කුඩා සිනමා කර්මාන්තයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව වැනි රටක් ලද ජයග්‍රහණයකි. මෙලෙස ලද ඇතැම් සම්මානයන් මෙරට නිසි ප්‍රශංසාවට බඳුන් වූ නමුදු, යම් සම්මානයන්හී පිළිගැනීම හා විශ්වාසනීයත්වය පිළිබඳ යම් ආන්දෝලනාත්මක කතිකාවතක් රටතුල ඇති කරලීමට හේතු සාධක විය. මෙම ලිපිය එකී ප්‍රශංසා, පිළිගැනීම් හා විවේචන මැදින් ගලාගිය 2015 වර්ෂයේ අන්තර්ජාතික සිනමා උළෙලයන්හී ශ්‍රී ලංකාව ලද ජයග්‍රහණයන් පිළිබඳ වූ විශ්ලේෂණයකි.

'මංගල ගමන' නියෝජනය කල විදෙස් සිනමාපට තරග අංශය උදෙසා පමණක්, හොඳම සිනමාපටය උදෙසා ජූරි සම්මානයක්, රයිසින් ස්ටාර් සම්මාන 10ක්, රෝයල් රීල් සම්මාන 10ක් සහ විශිෂ්ටතා සම්මාන 11ක් ඇතුළුව සම්මාන 32ක් 2015 වර්ෂයේදී පිරිනමන ලදී. 2007 වර්ෂයේදී ආරම්භය සනිටුහන් කල කැනඩා අන්තර්ජාතික සිනමා උළෙලේ, තරග අංශ 09ක් යටතේ සම්මාන පිරිනමන අතර, එකී සියළුම තරග අංශ උදෙසා 2015 වර්ෂයේදී පමණක් පිරිනමන ලද මුළු සම්මාන සංඛ්‍යාව 314කි.

02. හොඳම අධ්‍යක්ෂක - පටිභාන - 05 වෙනි සාර්ක් සිනමා උළෙල- (කොළඹ - ශ්‍රී ලංකාව) - මැයි,2015

03. හොඳම වෘත්තාන්ත සිනමාපටය - මෝටර් බයිසිකල් - 05 වෙනි සාර්ක් සිනමා උළෙල- (කොළඹ - ශ්‍රී ලංකාව) - මැයි,2015

04. හොඳම ළමා රංගනය උදෙසා වූ 'සිටි ඔෆ් ස්ලීන් ' සම්මානය (City of Zlin Award for Best Children Performance) - හෝ ගානා පොකුණ - 55 වෙනි ස්zලීන් සිනමා උළෙල - (ස්ලීන් - චෙක් ජනරජය) - ජූනි,2015

